# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 11 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය කාලය : පැය 3

- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

1) ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පැවති පාලන ක්‍රමයට නිදසුනක් වන්නේ .......................................... යි.
(නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය / වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය / ඍජු ප්‍රජාතන්ත්‍රවාදය)

2) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ලෙස සැලකෙන්නේ මහ නගර සභා නගර සභා සහ .......................................... ය.
(සුළු නගර සභා / ප්‍රාදේශීය සභා / පළාත් සභා)

3) ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක බෙදීම අනුව උතුරු පළාතට අයත් මැතිවරණ දිස්ත්‍රික්ක ගණන වන්නේ,.......................................... (3 / 5 / 4 / 6)

4) බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල් දෙක වන්නේ, ..........................................
(මහා බ්‍රිතාන්‍ය හා ඉන්දියාව / ඉන්දියාව හා ඇමරිකාව / ශ්‍රී ලංකාව හා ඉන්දියාව / කොරියාව හා ශ්‍රී ලංකාව)

5) 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රමය හසුරුවන ප්‍රධාන නායකයා වන්නේ .......................................... ය.
(අගමැතිය / කථානායකය / ජනාධිපතිය / අග්‍රාණ්ඩුකාරවයාය)

6) නීති පැනවීමටත් එම නීතිවලට ජනතාවගේ අවනතභාවය ලබා ගැනීමටත් ආධාරවන්නේ .......................................... යි.
(රාජ්‍ය සතු විධායක බලයයි/ රාජ්‍ය සතු ස්වාධිපති බලයයි/ රාජ්‍ය සතු විධායක බලයයි/ )

7) මැතිවරණයකදී ජනතාවට හිතකර ආණ්ඩු ක්‍රමයක් පත් කර ගැනීම .......................................... වගකීමකි.
(ජනතාවගේ / ඡන්ද දායකයාගේ/ දේශපාලන පක්ධවල/ සිවිල් සමාජයේ)

8) ආණ්ඩුවක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ .......................................... (ස්ථාවර ආයතනයක් වීම/ විවේචනය කළ හැකි වීම/ එක් පක්ෂයකින් සමත්වීම/ විවිධ ස්වරූපයේ ආණ්ඩු නොමැති වීම)

9) රටක උත්තරීතර ලේඛනය මෙන්ම මූලික නීතය ද වන්නේ ..........................................
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ මූලික අයිතිවාසිකම් ප්‍රඥප්තිය/ දණ්ඩනීති සංග්‍රහය)

10) ලන්දේසී යුගයේදී මෙරට ක්‍රියාත්මක වූ අධිකරණ දිස්ත්‍රික්කයක් නොවන්නේ, ..........................................
(යාපනය/ ගාල්ල/ කොළඹ/ මහනුවර)

11) බලය විමධ්‍යගත කිරීමේදී දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ,
    1. ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනතක් මගින් සිදුකිරීම.
    2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බලය බෙදා දැක්වීම.
    3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බලය පැවරීම.
    4. ප්‍රාදේශීය පාලන ඒකක වලට බලය පැවරීම

12) සංධීය රාජ්‍යවල නව ප්‍රවණතාවය වන්නේ,
   1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රාන්ත රාජ්‍යවලට වැඩි වාසි සැලසෙන ලෙස අර්ථ දැක්වීම.
   2. රාජ්‍ය සුබසාධන කාර්යයන්වල වගකීම ප්‍රාන්ත රාජ්‍යවලටම දරා ගැනීමට සිදුවීම.
   3. දෙවන ලෝක යුද්ධයෙන් පසුව අන්තර්ජාතික ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙන වෙනස නිසා මධ්‍යම ආණ්ඩුවේ බලය වැඩි වීම.
   4. මූල්‍ය ගණුදෙනුවලදී ප්‍රාන්ත රාජ්‍ය වලට වඩා වැඩි වැදගත්කමක් ලබාදීම.

13) ජාතික නිවාස හා ඉදිකිරීම් කටයුතු කිරීම,
   1. පළාත් සභාවක පළාත් සභා ලැයිස්තුවට අයත් බලයකි.
   2. පළාත් සභාවක සංවෘත ලැයිස්තුවට අයත් බලයකි.
   3. පළාත් සභාවක සමගාමී ලැයිස්තුවට අයත් බලයකි.
   4. පළාත් සභාවක පළාත් පාලන ලැයිස්තුවට අයත් බලයකි.

14) අතීතයේ සිට ශ්‍රී ලංකාව තුළ බලය විමධ්‍යගත කිරීම සිදු කිරීම සිදු වී ඇත. ඒ අනුව ගම්භාර ගාමිණී වැනි නිලධාරීන් ගම් පාලනය සඳහා යොදවා ගත්තේ,
   1. පොළොන්නරු යුගයේදී
   2. අනුරාධපුර යුගයේදී
   3. මහනුවර යුගයේදී
   4. කුරුණෑගල යුගයේදී

15) මධ්‍යම ආණ්ඩුවත් පළාත් සභාවත් අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ,
   1. මහ ඇමතිවරයා
   2. ආණ්ඩුකාරවරයා
   3. පළාත් අමාත්‍යවරයා
   4. පළාත් ලේකම්වරයා

16) ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බලතල ඇතුළත් පිළිතුර වන්නේ,
   1. ජාතික ආරක්ෂාව හා සංස්කෘතය
   2. අධ්‍යාපන හා මූල්‍ය කටයුතු
   3. අධ්‍යාපන හා සෞඛ්‍ය
   4. ජාතික ආරක්ෂාව හා අධ්‍යාපනය

17) ආර්ථික නොවන භාණ්ඩ ඇතුළත් පිළිතුර තෝරන්න.
   1. ආහාර, ඇඳුම්, ජලය
   2. හිරු එළිය, ජලය, වාතය
   3. ආහාර, ඖෂධ, වාතය
   4. හිරු එළිය, ජලය, ආහාර

18) බහු සංස්කෘතික ජන සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියා විසින් ප්‍රගුණ කළ යුතු මූලික ගුණාංගයක් වන්නේ,
   1. තම ආගමික කණ්ඩායම අතර සහයෝගයෙන් කටයුතු කිරීම.
   2. තම වාර්ගික කණ්ඩායම අතර සහයෝගයෙන් කටයුතු කිරීම.
   3. තම සංස්කෘතිය පමණක් උසස් ලෙස පිළිගැනීමයි.
   4. සමානාත්මතාවය වර්ධනය කරමින් සහජීවනය ගොඩ නැඟීමයි.

19) ධනවාදී අර්ථ ක්‍රමයක මූලික ලක්ෂණයක් නොවන්නේ,
   1. තරඟකාරී වෙළඳපොළක් පැවතීම.
   2. නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතු වීම.
   3. දේපළ අයිතිය රජය සතුවීම.
   4. ආදායම් අසමාන ලෙස බෙදී යාම.

20) පරිවර්තන ආර්ථිකයක ලක්ෂණයක් නොවන්නේ,
   1. පෞද්ගලික දේපළ අයිතියට ඉඩ සලසා දීම
   2. ආර්ථිකය ලිහිල්කරණය
   3. රාජ්‍ය ව්‍යවසායකයන් දිරි ගැන්වීම
   4. පාඩු ලබන ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම

21) වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකයේ නව සංවර්ධන ප්‍රවණතා අතර දේශීය යැපුම් කෘෂි අංශය දිරි ගැන්වීම සිදු කරනු ලැබුවේ කුමන යුගයේද?

1. 1948 - 1960
2. 1970 - 1977
3. 1961 - 1970
4. 194 - 2004

22) උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුමට අයත් නොවන රටක් වන්නේ,

1. ඇමරිකා එක්සත් ජනපදය
2. නේපාලය
3. කැනඩාව
4. මෙක්සිකෝව

23) ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ලොවට ඉදිරිපත් කරනු ලැබුයේ,

1. මහාචාර්ය ගානර්
2. ජොහාන් ගැල්ටුන්
3. ඇරිස්ටෝටල්
4. චාල්ස් එල්වුඩ්

24) වාර්ගිකත්වය පදනම් කරගත් ගැටුමකට උදාහරණයක් වන්නේ,

1. ඊශ්‍රායෙල් පලස්තීන ගැටුම
2. මාද පෙරදිග ගැටුම
3. දකුණු අප්‍රිකානු වර්ණභේදවාද ගැටුම
4. සෝමාලියාව හා ඉතියොපියාව අතර ගැටුම

25) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය හඳුන්වන්නේ,

1. උඩරට නීතිය නමින්
2. මුස්ලිම් නීතිය නමින්
3. තේසවලාමේ නීතිය නමින්
4. රෝම ලන්දේසි නීතිය නමින්

26) ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක ගණන වන්නේ,

1. 6
2. 5
3. 3
4. 4

27) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු කටයුතු මෙහෙයවන තැනැත්තා වන්නේ,

1. සභානායක තුමා
2. සභාපතිතුමා
3. ජනාධිපතිතුමා
4. කතානායකතුමා

28) ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා පිහිටුවා ඇති දුරකථන අංකය වන්නේ,

1. 1929
2. 1939
3. 1919
4. 119

29) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදී පදනම් කරගන්නා විශේෂ කරුණක් නොවන්නේ,

1. ආරක්ෂාව
2. විනය
3. පැවැත්ම සංවර්ධනය
4. සහභාගීත්වය

30) සදාචාරාත්මක යුතුකමක් නොවන්නේ,

1. සමාජ සිරිත් විරිත් වලට ගරු කිරීම
2. ජාතික උරුමයන් හා ජාතික සම්පත් සුරැකීම
3. පොදු දේපළ ආරක්ෂා කිරීම
4. පූජක උතුමන්ට ගරු කිරීම

31) අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසදලීමෙන්,

1. නීතිය වෙනුවට අවනීතිය ක්‍රියාත්මක වෙයි
2. රට තුළ සිදුවන අපරාධ හා දූෂණ මර්දනය වේ.
3. යුක්තිය ඉටු කර ගැනීමට අනියම් ක්‍රම භාවිතා කිරීමට සිදු වීම.
4. මිනිසුන් තුළ නීතියට ඇති ගෞරවය හීන වේ.

32) ලංකාවට ප්‍රථම වරට සීමිත ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,

1. කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
2. කෲ මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
3. මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
4. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

33) ලංකාවට සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,

1. කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
2. කෲ මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
3. මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
4. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

34) ශ්‍රී ලංකාව ස්වාධීන ස්වෛරී ජන රජයක් බවට පත් වූයේ,

1. 1972
2. 1948
3. 1994
4. 1980

35) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය හැඳින්වූ නිළ නාමය වන්නේ,

1. ජාතික රාජ්‍ය සභාව
2. පාර්ලිමේන්තුව
3. මහජන මන්ත්‍රී මණ්ඩලය
4. රාජ්‍ය මන්ත්‍රන සභාව

36) මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමා පනවා ඇත්තේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමන ව්‍යවස්ථාවෙන්ද?

1. 13 වන ව්‍යවස්ථාව මඟින්
2. 17 වන ව්‍යවස්ථාව මඟින්
3. 12 වන ව්‍යවස්ථාව මඟින්
4. 15 වන ව්‍යවස්ථාව මඟින්

37) පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආයතනය වන්නේ,

1. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
2. භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය
3. ජාතික ඉඩම් ගොඩ කිරීමේ අධිකාරිය
4. සෞඛ්‍ය අමාත්‍යාංශය

38) පානය කිරීම සඳහා සුදුසු පිරිසිදු ජලයේ අගය කීයද?

1. 7.01
2. 7.00
3. 4.01
4. 4.00

39) පරිසර පද්ධතියේ අජෛවී සංරචකයක් නොවන්නේ,

1. වායු ගෝලය
2. මිරිදිය ජලාශ
3. පාෂාණ
4. ශාක

40) ස්වභාවික පරිසරයට අයත් නොවන ප්‍රපංචයක් නොවන්නේ,

1. වනාන්තර
2. ශාක වර්ග
3. කුල උරුම
4. කඳු පන්ති

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

1)

i) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේදී ක්‍රියාත්මක කිරීමේදී මතු වන ගැටළු 2ක් ලියන්න.
ii) නූතන රාජ්‍යයන්හි මූලික වශයෙන් දක්නට ලැබෙන ආණ්ඩුක්‍රම 2 ලියන්න.
iii) අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් වර්ග 2ක් ලියන්න.
iv) බලය සමාජ විද්‍යාත්මකව නිර්වචනය කර ඇත්තේ කෙසේද?
v) ඇමරිකානු ජනාධිපතිවරයා විසින් බලතල ක්‍රියාවට නැංවීමේදී සෙනෙට් සභාවේ අනුමැතිය ලබාගත යුතු අවස්ථා 02ක් ලියන්න.
vi) සවර්ධන ක්‍රියාවලින් ශ්‍රී ලංකාවට අත්වන වාසි 2ක් ලියන්න.
vii) නීතියේ මූලාශ්‍ර 02ක් ලියන්න.
viii) මහාධිකරණය සතු අධිකරණ බලතල 2ක් ලියන්න.
ix) ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සඳහා වර්තමානයේ පිහිටුවා ඇති ආයතන 2 ලියන්න.
x) මානව අයිතිවාසිකම් වර්ග කළ හැකි ප්‍රධාන කොටස් 2 ලියන්න.

2)

i) මුලින් ම බිහි වූ ජාතික රාජ්‍ය 2 නම් කරන්න.
ii) ජාතික රාජ්‍යයක මූලික ලක්ෂණ 3ක් ලියන්න.
iii) රාජ්‍යයකට පැවරෙන කාර්යයන් 3ක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

3)

i) සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් 2ක් ලියන්න.
ii) පළාත් සභාවක ආණ්ඩුකාරවරයා සතු කාර්යයන් 3ක් ලියන්න.
iii) පළාත් පාලන ආයතන මඟින් සපයන සේවාවන් 3ක් නම් කර ඉන් එකක් ප්‍රදේශයේ සංවර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

4)

i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් වීමට බලපෑ හේතු 2ක් ලියන්න.
ii) රටක ආර්ථික හා මානව සම්පත නිසියාකාරව කළමනාකරණය නොකිරීමෙන් ඇතිවන අර්බුධ 3ක් ලියන්න.
iii) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමේ වැදගත්කම කරුණු 3ක් ඇසුරින් පෙන්වා දී ඉන් එක් කරුණක් පැහැදිලි කරන්න.

5)

i) පහත සඳහන් වර්ෂවලදී මෙරට ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ නම් කරන්න.
   1. 1921
   2. 1947
ii) ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යුහය සකස් වී ඇති ආයතන තුන නම් කරන්න.
iii) පලාත් සභාවල හා පළාත් පාලන ආයතන වල ප්‍රයෝජන 3ක් නම් කර ඉන් ප්‍රයෝජනයක් පැහැදිලි කරන්න.

6)

i) අන්තර් ජාතික නීතිය ඇසුරින් පැන නැඟුණු නීති ශාඛා 2ක් ලියන්න.
ii) විශේෂ පාර්ලිමේන්තු පනත් මඟින් පිහිටුවා ඇති අධිකරණ බලතතල සහිත ආයතන 3ක් ලියන්න.
iii) ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය සම්බන්ධ ප්‍රධාන භූමිකා 3ක් නම් කර ඉන් එක් භූමිකාවක් කෙටියෙන් පැහැදිලි කරන්න.